Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

## කාර්ය පත්‍රිකාව 01

- **නිපුණතාවය :** සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග හා සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

- **පාඩම** : ජයජයවන්ති රාගය ගයමු වයමු.

- **ඉගෙනුම් ඵල :**
  - ජයජයවන්ති රාගයේ ස්වර අභ්‍යාස ගායනය වාදනය කරයි.
  - ජයජයවන්ති රාගයේ රාග ලක්ෂණ හා ස්වභාවය අවබෝධ කරගනී.
  - ජයජයවන්ති සරිගම් ගායනය වාදනය කරයි.
  - මාධ්‍යලය ගී ගායනය වාදනය කරයි.
  - ජයජයවන්ති රාගයේ ආලාප හා මධ්‍යාලාප ගායනය වාදනය කරයි.
  - තානාලංකාර නිර්මාණය කර ගායනය වාදනය කරයි.

- **ශිෂ්‍යයා සතු කාර්යයන් :**
  - ජයජයවන්ති රාගයේ ස්වර අභ්‍යාස, සර්ගම්, මධ්‍යලය, ගී, ආලාප, මධ්‍යාලාප, තානාලංකාර ගායන වාදන පුහුණුව
  - ජයජයවන්ති රාගය ලියවී ඇති ග්‍රන්ථ අධ්‍යයනය කරන්න.
  - එම ගායන වාදන ඇතුලත් වීඩියෝ නරඹන්න.
  - ජයජයවන්ති රාගයේ රාගාංග හා ප්‍රධාන ස්වර සංගති පිළිබඳ හොඳින් අධ්‍යයනය කරන්න.

- **ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කරගත හැකි websites :**
  - https://youtu.be/6P_rEEiMYk4
  - https://youtu.be/2JHoNNCZDb4

- **ආශ්‍රිත අතිරේක ග්‍රන්ථ :**
  - මහාචාර්ය සංගීත් නිපුන් සනත් නන්දසිරි රාගාලංකාරය
  - මහාචාර්ය දයා රත්නසේකර හින්දුස්ථානි සංගීත ආක්ෂිප්තිකා තරංගනී තෘතීය භාගය
  - ආචාර්ය ප්‍රේමදාස මුදුන්කොටුව සම්භාව්‍ය සංගීත කෘතීන්

- **ඇගයීම් :**
  - රාගයේ ආරෝහණ, අවරෝහණ, ආලාප නිවැරදි ශ්‍රැතියට ගායනා කරන්න.
  - ජයජයවන්ති රාගය රාග විස්තරය ලියා දක්වන්න.
  - ජයජයවන්ති රාගයේ මධ්‍යලය ගීතය හා තානාලංකාර නිවැරදි ශ්‍රැතියට හා තාලයට ගායනා කරන්න.
  - ජයජයවන්ති සර්ගම් ගීතය නිවැරදි තාල සංඥා යොදා ප්‍රස්තාර කරන්න.
  - ජයජයවන්ති රාගයේ මධ්‍යලය ගීතය, ගීත ස්වර ප්‍රස්තාර කර තානාලංකාර හතරක් ලියන්න.

- **පසු ක්‍රියාකාරකම් :**
  - ජයජයවන්ති රාගයට අයත් වෙනත් මධ්‍යලය ගීත සොයා බලා ශ්‍රවණය කිරීමට යොමුවන්න